සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

8 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 34 S

නම/ විභාග අංකය ......................................

# විද්‍යාව

කාලය පැය දෙකයි

උපදෙස් :
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.
- සෑම පිළිතුරකටම ලකුණු 2 බැගින් හිමි වේ.
- 1-25 දක්වා ප්‍රශ්න වල නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

## I කොටස

1. මාළු හා මස් වැනි ආහාර මත ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරිත්වය හඳුන්වන නම කුමක් ද?
   1. මුඩු වීම  2. පැසීම  3. පූතිභවනය  4. ආහාර නරක්වීම

2. වායුගෝලීය ජල වාෂ්ප අවශෝෂණය සඳහා හැඩ ගැසුණු ශාකයකට උදාහරණයකි,
   1. ඇන්තූරියම්  2. කිරල  3. බේඳුරු  4. ඕකිඩ්

3. ජල සංරක්ෂණය හා නව ශාක බිහි කිරීම සිදු කළ හැකි ශාක පත්‍රයකි,
   1. කෝමාරිකා  2. අක්කපාන  3. ඉඟුරු  4. ගොටුකොළ

4. වායව කඳේ ආහාර තැන්පත් කර ඇති ශාකයකි,
   1. කිතුල්  2. කෙසෙල්  3. කැරට්  4. අර්තාපල්

5. අරීය සමමිතියක් හා ද්විපාර්ශ්වික සමමිතියක් සහිත සතුන් පිළිවෙලින් දක්වා ඇති පිළිතුර කුමක් ද?
   1. හයිඩ්‍රා, මුහුදු මල  2. ගෝනුස්සා, මුහුදු මල
   3. ලොඩියා, ඉස්සා  4. මුහුදු මල, ලොඩියා

6. ආලෝක අන්වීක්ෂයෙන් නිරීක්ෂණය කළ **නොහැකි** ක්ෂුද්‍ර ජීවී කාණ්ඩය වන්නේ
   1. බැක්ටීරියා  2. දිලීර  3. ප්‍රොටෝසෝවා  4. වෛරස්

7. බුහුබාවා සහ මෙඩුසා යන ස්වරූප දෙකක් නිරීක්ෂණය කළ හැකි සත්ත්ව කාණ්ඩය කුමක් ද?
   1. ඇනලිඩා  2. නිඩාරියා  3. මොලුස්කා  4. ආත්‍රොපෝඩා

8. ක්ෂුද්‍ර ජීවීන්ගෙන් සිදුවන අහිතකර බලපෑමක් වනුයේ,
   1. මැරුණු ශාක හා සත්ත්ව කොටස් වියෝජනය වීමය.
   2. ක්ෂුද්‍ර ජීවීන් යොදා ගැනීම මගින් පලිබෝධ පාලනය වීමය.
   3. බේකරි ආහාර නිෂ්පාදනයේ දී භාවිතයට ගැනීමය.
   4. අජීවී පෘෂ්ඨ මත දිලීර වර්ධනය වීමෙන් ආර්ථික හානි සිදු වීමය.

9. ශීතකරණයක තබන ලද ආහාර මත ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරිත්වය පාලනය කරන සාධක ලෙස සැලකිය හැක්කේ,
   1. උෂ්ණත්වය හා ආලෝකය  2. ආලෝකය හා තෙතමනය
   3. pH අගය හා උෂ්ණත්වය  4. තෙතමනය හා උෂ්ණත්වය

10. කාබන්ඩයොක්සයිඩ් සෑදී ඇති මූලද්‍රව්‍ය වන්නේ,
   1. හයිඩ්‍රජන් හා කාබන්  2. කාබන් හා ඔක්සිජන්
   3. හයිඩ්‍රජන් හා නයිට්‍රජන්  4. හයිඩ්‍රජන් හා ක්ලෝරීන්



LIVEWORKSHEETS

11. යම් ද්‍රව්‍යයක ඒකක පරිමාවක ස්කන්ධය හැඳින්වෙන්නේ
   1. බර ලෙසය.
   2. ඝනත්වය ලෙසය.
   3. පීඩනය ලෙසය.
   4. ද්‍රවාංකය ලෙසය.

12. පහත දැක්වෙන ද්‍රව්‍ය අතරින් මූලද්‍රව්‍යයක් හා සංයෝගයක් දැක්වෙන පිළිතුර වන්නේ,
   1. සල්ෆර් හා ජලය
   2. ජලය හා ඇමෝනියා
   3. ලුණු හා ජලය
   4. සල්ෆර් හා කාබන්


13. ද්‍රව්‍යයක සංශුද්ධතාව හඳුනා ගැනීමට යොදාගත හැකි භෞතික ගුණයකි,
   1. තාපාංකය
   2. වර්ණය
   3. සන්නයනය
   4. ප්‍රසාරණය

14. සල්ෆර් කැබැල්ලක් රෙදි උරයකට දමා මිටියකින් තැලූ විට කැබලි වලට කැඩුණි. එම නිරීක්ෂණය අනුව සල්ෆර්
   1. තන්‍ය වේ.
   2. ආඝාත්‍ය වේ.
   3. භංගුර වේ.
   4. ප්‍රත්‍යස්ථ වේ.

15. ඉහළ ඝනත්ව සහිත පදාර්ථ අවස්ථා වන්නේ,
   1. ඝන සහ වායු පමණි.
   2. ද්‍රව සහ වායු පමණි.
   3. ඝන සහ ද්‍රව පමණි.
   4. ඝන, ද්‍රව සහ වායු සියල්ලමය.

16. නියත සංයුතියක් රහිත ද්‍රව්‍යයකි.
   1. යකඩ
   2. වාතය
   3. මැග්නීසියම්
   4. හයිඩ්‍රජන්

17. ප්‍රභාසංශ්ලේෂණය සිදුවන පත්‍රයක දළ සටහනක් රූපයේ දැක්වේ.




   මෙහි A හා B වලින් දැක්වෙන ද්‍රව්‍ය වන්නේ පිළිවෙලින්,
   1. කාබන්ඩයොක්සයිඩ් සහ හරිතප්‍රදය.
   2. ජලය සහ කාබන්ඩයොක්සයිඩ් ය.
   3. ජලය සහ හරිතප්‍රදය.
   4. කාබන්ඩයොක්සයිඩ් සහ ජලය ය.

18. ජලය හා ලුණු සමාන පරිමාවක ස්කන්ධය සම්බන්ධයෙන් පහත ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
   1. ලුණු හා ජලය ස්කන්ධයෙන් සමාන වේ.
   2. ලුණු වල ස්කන්ධය අඩුය. ජලයේ ස්කන්ධය වැඩිය.
   3. ලුණු හා ජලයේ ස්කන්ධ වෙනස් වේ.
   4. ලුණු වල ස්කන්ධය වැඩිය. ජලයේ ස්කන්ධය අඩුය.

19. විද්‍යුත් සන්නායක අලෝහමය ද්‍රව්‍යයකි.
   1. කාබන්
   2. රසදිය
   3. සල්ෆර්
   4. ඊයම්

20. රූපයේ දැක්වෙන පත්‍ර වින්‍යාසයක් ඇති ශාකයකි.
   1. පේර
   2. රුක් අත්තන
   3. කටු අනෝදා
   4. කුප්පමේනියා





LIVEWORKSHEETS

21. ද්‍රව්‍යයක ද්‍රවාංකය සෙවීමේ දී ලැබෙන නිරීක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
A. ඝනය ද්‍රවයක් බවට පත් වේ.
B. උෂ්ණත්වය ක්‍රමයෙන් වැඩි වේ.
C. උෂ්ණත්වයේ වෙනසක් සිදු නොවී නියතව පවතී.

ඉහත නිරීක්ෂණ වලින් සත්‍ය වනුයේ
1. A හා B 2. B හා C 3. A හා C 4. A, B, C සියල්ල


22. රසදිය උෂ්ණත්වමාන ද්‍රවයක් ලෙස යොදා ගනී. රසදිය පිළිබඳ ශිෂ්‍යයෙක් කළ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
(A) සංශුද්ධ ද්‍රව්‍යයකි
(B) අලෝහමය ද්‍රවයකි
(C) තාපය ලැබුණ විට ප්‍රසාරණය වේ

ඉහත ප්‍රකාශ වලින් නිවැරදි වන්නේ
1. A හා B පමණි 2. B හා C පමණි 3. A හා C පමණි 4. A, B, C සියල්ල

23. සංගීත නාද සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A. කිසි විටෙකත් පීඩාකාරී නොවේ.
B. රිද්මයානුකූලව ගැයෙන හෝ වැයෙන ඒවා වේ.
C. ජීවයේ ගුණාත්මක බව වර්ධනයට යොදාගනී.

ඉහත ප්‍රකාශ වලින් නිවැරදි වන්නේ,
1. A හා B 2. B හා C 3. A හා C 4. A, B, C සියල්ල

24. A, B යනු කියත් පටියක කොටසකි. එහි දිග වැඩි කරමින් සෑම අවස්ථාවකම B කෙළවරට බලයක් යෙදූ විට ඇතිවන ශබ්දය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?




1. ශබ්දයේ වෙනසක් සිදු නොවේ.
2. ශබ්දය ක්‍රමයෙන් වැඩි වේ.
3. ශබ්දය අඩුවී පසුව වැඩි වේ.
4. ශබ්දය ක්‍රමයෙන් අඩුවෙමින් ගොස් නැසී යයි.

25. පදාර්ථ **පමණක්** අඩංගු පිළිතුර කුමක් ද?
1. ජලය, වාතය, දූවිලි
2. ජලය, තාපය, වාතය
3. ධ්වනිය, ජලය, දූවිලි
4. ජලය, දූවිලි, ආලෝකය



LIVEWORKSHEETS

## II කොටස

උපදෙස් :
- ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.
- පිළිතුරු සඳහා වෙනම කඩදාසි භාවිතා කරන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 12 බැගින් හිමි වේ.

1. සත්ත්ව වර්ගීකරණය සඳහා යොදාගත් ජීවීන් කිහිපදෙනෙකු පහත රූප වල දක්වේ.




i. වර්ගීකරණයේ දී ගැඬවිලා සහ ගැරඬියා ප්‍රධාන සත්ත්ව කාණ්ඩ දෙකකට වර්ග කර ඇත. මේ සඳහා යොදාගෙන ඇති අභ්‍යන්තර ලක්ෂණය කුමක් ද? (ල. 01)


ii. ගොළුබෙල්ලා, මොලුස්කා කාණ්ඩයට අයත් වේ.
   a) එම කාණ්ඩයට අයත් සමහර සතුන්ගේ නිරීක්ෂණය කළ හැකි ලක්ෂණයක් රූපයේ දක්වේ. එය කුමක් ද? (ල. 01)
   b) ඔබ සඳහන් කළ ලක්ෂණය නොමැති මොලුස්කා කාණ්ඩයට අයත් සත්ත්වයෙකු නම් කරන්න. (ල. 01)
   c) ගොළුබෙල්ලාගේ සංචරණ අවයවය කුමක් ද? (ල. 02)

iii. ගැරඬියා භෞමික ජීවිතයට හොඳින් අනුවර්තනය වූ පෘෂ්ඨවංශී සත්ත්වයෙකි.
   a) ගැරඬියා අයත් වන සත්ත්ව කාණ්ඩය කුමක් ද? (ල. 01)
   b) ශ්වසනය සඳහා පෙනහැලි තිබීම හැරුණු විට එම සත්ත්ව කාණ්ඩයේ වෙනත් පොදු ලක්ෂණයක් ලියන්න. (ල. 01)

iv. ගැඬවිලා අයත් වන සත්ත්ව කාණ්ඩයේ සතුන් සඛණ්ඩ පණුවක් ලෙසද හැඳින්වේ.
   a) මොවුන් සඛණ්ඩ පණුවන් ලෙස හැඳින්වීමට හේතුව කුමක් ද? (ල. 01)
   b) වගා බිමක එම සත්ත්වයා සිටීමෙන් ඇති ප්‍රයෝජනයක් ලියන්න. (ල. 01)

v. ඉහත සතුන් අතරින් පහත එක් එක් ලක්ෂණය දරණ සතුන් තෝරා ලියන්න.
   a) සන්ධි සහිත උපාංග වලින් යුක්ත ඛණ්ඩනය වූ ශරීරයක් තිබීම, (ල. 01)
   b) ශ්වසනය සඳහා ජලක්ලෝම තිබීම. (ල. 01)
   c) පූර්ව ගාත්‍ර පියාපත් බවට පත්ව ඇත. (ල. 01)

2. (A) පදාර්ථය සැකසී ඇති ආකාරය පිළිබඳව පැහැදිලි කිරීම සඳහා සිදු කළ ක්‍රියාකාරකමක් පහත රූපයේ දක්වේ. බීකරය තුළ ඇති වීදුරු බෝල මගින් පදාර්ථයේ සැකැස්ම නිරූපණය කරයි,





   i. වීදුරු බෝල යොදාගෙන ඇත්තේ පදාර්ථය සෑදී ඇති කවර කොටසක් නිරූපණය කිරීමට ද? (ල. 01)
   ii. වීදුරු බෝලවල පිහිටීම අනුව පදාර්ථය පවතින භෞතික අවස්ථාව කුමක් ද? (ල. 01)
   iii. ක්‍රියාකාරකම සිදු කළ විට ලැබෙන නිරීක්ෂණයක් ලියන්න. (ල. 01)
   iv. එම නිරීක්ෂණ ඇසුරෙන් ලබා ගත හැකි නිගමනය ලියන්න. (ල. 02)



LIVEWORKSHEETS

B) පදාර්ථය සැකසී ඇති ආකාරය අනුව පදාර්ථයේ භෞතික ගුණ වෙනස් වේ. එක්තරා භෞතික ගුණයක් පෙන්වීම සඳහා යොදාගත් ක්‍රියාකාරකමක් හා ඉන් ලබාගත් නිරීක්ෂණ පහත දැක්වේ. X හා Y ගලා යාමේ හැකියාව ඇති පදාර්ථ වේ.





| ක්‍රියාකාරකම | A සිරිංජරයේ නිරීක්ෂණය | B සිරිංජරයේ නිරීක්ෂණය |
|---|---|---|
| පිස්ටන වලට එකවර ම සමාන බල යෙදීම | පිස්ටනයේ පිහිටීමේ වෙනසක් නැත. | පිස්ටනය, සිරිංජරය තුළට තල්ලු වේ |

i. X හා Y සඳහා භාවිත කර ඇතැයි සිතිය හැකි ද්‍රව්‍ය වලට උදාහරණයක් බැගින් ලියන්න. (ල. 02)


ii. B සිරිංජරයේ නිරීක්ෂණයට
   a. හේතුව පැහැදිලි කරන්න. (ල. 02)
   b. හේතුවට අනුව පදාර්ථය සතු භෞතික ගුණය ලියන්න. (ල. 01)

iii. ගලායාමේ ගුණයට අමතරව X හා Y පදාර්ථවල සමාන භෞතික ගුණයක් ලියන්න. (ල. 02)

3. පදාර්ථය වර්ගීකරණය කර ඇති සංකල්ප සිතියමක් පහත දැක්වේ.
   i. (A) P, Q, R, S සඳහා සුදුසු වචන ලියන්න. (ල. 04)




(B) ලෝහ සතු භෞතික ගුණයක් පෙන්වා දීමට සිදු කළ ක්‍රියාකාරකමක් රූපයේ දැක්වේ.





i. ටික වේලාවකට පසුව ලැබෙන නිරීක්ෂණය කුමක් ද? (ල. 01)
ii. ඉහත නිරීක්ෂණයට හේතුව සඳහන් කරන්න. (ල. 01)
iii. හැන්ද සාදා ඇති ලෝහය සතු කවර භෞතික ගුණයක් මෙම ක්‍රියාකාරකමෙන් පෙන්වා දිය හැකි ද? (ල. 01)
iv. නිරීක්ෂණය ලබා ගැනීමට මාගරින් යොදා ගෙන ඇත්තේ මාගරින් සතු කවර භෞතික ගුණයක් නිසා ද? (ල. 01)
v. ලෝහ හැන්ද වෙනුවට පොල්කටු හැන්දක් භාවිත කළේ නම් ලැබෙන නිරීක්ෂණය කුමක් ද? (ල. 01)
vi. ඉහත (v) නිරීක්ෂණයට හේතුව කුමක් ද? (ල. 01)
vii. ජලය සෑදීමට එකතු වී ඇති මූලද්‍රව්‍ය මොනවා ද? (ල. 02)



LIVEWORKSHEETS

4. ප්‍රදර්ශණයක් සඳහා සැකසූ සංගීත භාණ්ඩයක් පහත දක්වේ,




i. ධ්වනිය නිපදවන ආකාරය අනුව ඉහත සංගීත භාණ්ඩය කවර වර්ගයකට අයත් ද? (ල. 01)

ii. ප්‍රතිඵලය ලෙස තියුණු හඬක් ලබා ගැනීමට,

a) කම්පනය කළ යුතු කම්බියේ අක්ෂරය කුමක් ද? (ල. 01)

b) එම ප්‍රතිඵලය ලබාදීමට හේතු වූ කම්බිය සතු භෞතික ගුණය ලියන්න. (ල. 01)

iii. සංගීත භාණ්ඩයේ B කම්බිය ඇදීමට ලක් කිරීමෙන් නැගෙන ශබ්දය වෙනස් කර ගත හැක. ඒ සඳහා ගත හැකි ක්‍රියා මාර්ගයක් ලියන්න. (ල. 02)

iv. මෙම සංගීත භාණ්ඩය සෑදීමේදී යොදාගෙන ඇති,


a) මූලද්‍රව්‍ය දෙකක් ලියන්න. (ල. 02)

b) පරිවාරක ද්‍රව්‍ය දෙකක් ලියන්න, (ල. 02)

v. යකඩ ලෝහය මුදුවක් ලෙස සැකසීමේදී ලෝහය සතු කවර භෞතික ගුණයක් භාවිත වී ඇති ද? (ල. 01)

vi. ඉහත සංගීත භාණ්ඩයේ ධ්වනිය නිපදවන ක්‍රමය හැර ධ්වනිය නිපදවිය හැකි අනෙක් ක්‍රම දෙක සඳහන් කරන්න. (ල. 02)

5. (A) ආහාර මත ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය සඳහා ශිෂ්‍යයෙක් නිවසේදී සැකසූ ඇටවුමක් රූපයේ දැක්වේ.




i. P ලෙස යොදාගෙන ඇති ක්ෂුද්‍ර කාණ්ඩය කුමක් ද? (ල. 01)

ii. සීනි ද්‍රාවණය බෝතලයට ඇතුළු කිරීමට ගත යුතු ක්‍රියාමාර්ගය කුමක් ද? (ල. 01)

iii. ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය වේගවත් කිරීමට ශිෂ්‍යයා යොදාගෙන ඇති උපක්‍රමය කුමක් ද? (ල. 01)

iv. මිනිත්තු කිහිපයකට පසු, ලැබෙන නිරීක්ෂණය බැගින් සඳහන් කරන්න. (ල. 02)

a) බෝතලය තුළ

b) බැලූනයේ

v. බැලූනය ඉවත් කර සේලයින් බටය Q බඳුනේ හුණු දියර තුළට ඇතුළු කළේ නම්

a) ලැබෙන නිරීක්ෂණය කුමක් ද? (ල. 01)

b) නිරීක්ෂණයට අනුව පිටවී ඇති වායුව කුමක් ද? (ල. 01)



LIVEWORKSHEETS

(B) ක්ෂුද්‍ර ජීවීන් මිනිසාට සහ මිනිස් ක්‍රියාකාරකම්වලට හිතකර මෙන්ම අහිතකරව ද බලපායි.

i. ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය නිසා ආහාරවල සිදුවන වෙනස්කම් අතරින් ඔබට,

a) නිරීක්ෂණය වන වෙනස් වීමක්

b) නිරීක්ෂණය නොවන වෙනස් වීමක් ලියන්න. (ල. 02)


ii. පහත දැක්වෙන රෝග සඳහා රෝගකාරක වන ක්ෂුද්‍ර ජීවී කාණ්ඩය ලියන්න.

a) ඇමීබා අතීසාරය (ල. 01)

b) අළුහම් (ල. 01)

iii. වෛද්‍ය ක්ෂේත්‍රයේදී ක්ෂුද්‍ර ජීවීන් හිතකර ලෙස යොදා ගන්නා අවස්ථාවක් ලියන්න. (ල. 01)

6. පහත දැක්වෙනුයේ නුග ශාකයකි.




i. ප්‍රධාන මූල පද්ධති දෙක අතරින් මෙම ශාකයේ තිබිය හැකි මූල පද්ධතිය කුමක් ද? (ල. 01)

ii. ඉහත පිළිතුර තීරණය කිරීම සඳහා යොදාගත හැකි ලක්ෂණයක් රූපය ඇසුරෙන් ලියන්න. (ල. 01)

iii. කරු මුල් මගින් ශාකයට ඇති ප්‍රයෝජනය කුමක් ද? (ල. 01)

iv. කරු මුල් හැරුණු විට පරිසරයේ නිරීක්ෂණය කළ හැකි ආගන්තුක මුල් වර්ගයක නම සඳහන් කර එහි කාර්යයක් ලියන්න. (ල. 02)

v. මෙම ශාකයේ පත්‍ර ඝනකම්ව හා දිලිසෙන පෘෂ්ඨයක් සහිත වේ.

a) මෙම අනුවර්තනය ශාකයේ සිදුවන කවර ක්‍රියාවලියක් අවම කර ගැනීම සඳහා ප්‍රයෝජනවත් වේද? (ල. 01)

b) මෙම අනුවර්තනය හැර ඉහත ක්‍රියාවලිය අවම කර ගැනීමට දක්වන වෙනත් අනුවර්තනයක් ලියන්න. (ල. 01)

(B) සිසුන් හඳුනාගත් ශාක කිහිපයක් පහත දැක්වේ.
(කැරට්, ඉඟුරු, බතල, කිතුල්, රෝස, පතොක්, අක්කපාන, කරපිංචා)

ඉහත ශාක අතුරින්,

i. මුදුන් මුලේ ආහාර තැන්පත් කර ඇති ශාකයක් නම් කරන්න. (ල. 01)

ii. භූගත කඳක ආහාර තැන්පත් කර ඇති ශාකය කුමක් ද? (ල. 01)

iii. කාලතරණය සඳහා හැඩගැසී ඇති ශාකය නම් කරන්න. (ල. 01)

iv. කඳේ ජලය තැන්පත් කර ඇත්තේ කුමන ශාකයේ ද? (ල. 01)

v. නව ශාක බිහිකිරීම මුල් මගින් සිදු කරන ශාකය කුමක් ද? (ල. 01)



LIVEWORKSHEETS

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**පළමු වාර පරීක්ෂණය - 2019**
**8 ශ්‍රේණිය - විද්‍යාව**
**පිළිතුරු පත්‍රය**

I කොටස

| ප්‍රශ්. අංක | පිළිතුර | ප්‍රශ්. අංක | පිළිතුර | ප්‍රශ්. අංක | පිළිතුර | ප්‍රශ්. අංක | පිළිතුර | ප්‍රශ්. අංක | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 3 | 6 | 4 | 11 | 2 | 16 | 2 | 21 | 3 |
| 2 | 4 | 7 | 2 | 12 | 1 | 17 | 2 | 22 | 3 |
| 3 | 2 | 8 | 4 | 13 | 1 | 18 | 4 | 23 | 2 |
| 4 | 1 | 9 | 4 | 14 | 3 | 19 | 1 | 24 | 4 |
| 5 | 3 | 10 | 2 | 15 | 3 | 20 | 2 | 25 | 1 |

II කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| 01. | I. | | | කොඳු ඇට පෙළක් / කශේරුවක් තිබීම හෝ නොතිබීම | (ල. 01) |
| | ii. | (a) | | බාහිර කවචය/ස්පර්ශක තිබීම | (ල. 01) |
| | | (b) | | හංගොල්ලා/බුවල්ලා/දැල්ලා | (ල. 01) |
| | | (c) | | පේශිමය පාදය | (ල. 02) |
| | iii. | (a) | | රෙප්ටීලියා / උරගයින් | (ල. 01) |
| | | (b) | | ග්‍රන්ථි වලින් තොර කොරල සහිත වියළි සමක් තිබීම / සුදුසු පිළිතුරකට | (ල. 01) |
| | iv. | (a) | | දේහය කණ්ඩ වලට බෙදී තිබීම | (ල. 01) |
| | | (b) | | පස ගුල් හැරීම නිසා වාතනය වීම / ගැඩවිල් පස් එකතු වීම නිසා පස සාරවත් වීම | (ල. 01) |
| | v. | (a) | | තණකොළ පෙත්තා | (ල. 01) |
| | | (b) | | තිලාපියා | (ල. 01) |
| | | © | | මයිනා | (ල.01) |
| | | | | | මු.ල.12 |
| 02. | (A) | i. | | අංශු | (ල. 01) |
| | | ii. | | ඝන අවස්ථාව | (ල. 01) |
| | | iii. | | අවකාශ අතරට සියුම් වැලි ගමන් කිරීම | (ල. 01) |
| | | iv. | | අසන්තත බව වීම / අංශුමය ස්වභාවය / පදාර්ථය අංශු වලින් සමන්විත වීම හා ඒවා අතර අවකාශ පැවතීම | (ල. 02) |
| | (B) | i. | | X සඳහා ද්‍රවයකට උදාහරණයක් | (ල. 01) |
| | | | | Y සඳහා වායුවකට උදාහරණයක් | (ල. 01) |
| | | ii. | (a) | අංශු අතර විශාල ඉඩ ප්‍රමාණයක් තිබීම | (ල. 02) |
| | | | (b) | සම්පීඩනතාව | (ල. 01) |
| | | iii. | | නිශ්චිත හැඩයක් නොමැත | (ල. 02) |
| | | | | | මු.ල.12 |
| 03. | (A) | I. | | P- සංශුද්ධ ද්‍රව්‍ය | (ල. 01) |
| | | | | Q- මූලද්‍රව්‍ය | (ල. 01) |
| | | | | R- සංයෝග | (ල. 01) |
| | | | | S- සංශුද්ධ නොවන ද්‍රව්‍ය / මිශ්‍රණ | (ල. 01) |
| | (B) | I. | | මාගරින් දිය වීම | (ල. 01) |
| | | ii. | | ලෝහ හැන්ද දිගේ තාපය ගමන් කර මාගරින් වලට ලැබීම | (ල. 01) |
| | | iii. | | තාප සන්නායකතාව | (ල. 01) |
| | | iv. | | තාපය ලැබුණු විට මාගරින් දිය වීම | (ල. 01) |
| | | v. | | මාගරින් දිය නොවීම | (ල. 01) |
| | | vi. | | දුර්වල තාප සන්නායක වීම | (ල. 01) |
| | | vii. | | හයිඩ්‍රජන් හා ඔක්සිජන් | (ල. 02) |
| | | | | | මු.ල.12 |
| | | | | | |



LIVEWORKSHEETS

| | | | | | |
|---|---|---|---|---|---|
| 04. | I. | | | තන්තු කම්පනය වන | (ල. 01) |
| | ii. | (a) | | A | (ල. 01) |
| | | (b) | | කම්බිය සිහින් වීම | (ල. 01) |
| | iii. | | | පඩි ඉවත් කිරීම හෝ පඩි අලුතෙන් දැමීම | (ල. 02) |
| | iv. | (a) | | තඹ හා යකඩ | (ල. 02) |
| | | (b) | | ප්ලාස්ටික් හා ලී | (ල. 02) |
| | v. | | | තන්‍යතාව | (ල. 01) |
| | vi. | | | පටල කම්පනයෙන් හා වායු කම්පනයෙන් | (ල. 02) |
| | | | | | මු.ල.12 |
| 05. | (A) | i. | | යීස්ට් | (ල. 01) |
| | | ii. | | පිස්ටනය පහළට තෙරපීම | (ල. 01) |
| | | iii. | | $40^{0}C$ ක උෂ්ණත්වයෙන් යුතු සීනි ද්‍රාවණයක් යොදා ගැනීම | (ල. 01) |
| | | iv. | (a) | සුදු පැහැති පෙණ ඇති වීම | (ල. 01) |
| | | | (b) | බැලූනය පිම්බීම | (ල. 01) |
| | | v. | (a) | හුණු දියරය කිරි පැහැ වීම | (ල. 01) |
| | | | (b) | කාබන්ඩයොක්සයිඩ් වායුව | (ල. 01) |
| | (B) | i. | (a) | වර්ණය / වයනය / ගන්ධය / රස | (ල. 01) |
| | | | (b) | පෝෂණ ගුණය | (ල. 01) |
| | | ii. | (a) | ප්‍රොටොසෝවා } | (ල. 01) |
| | | | (b) | දිලීර } | (ල. 01) |
| | | iii. | | ගැළපෙන පිළිතුරකට | (ල. 01) |
| | | | | | මු.ල.12 |
| 06. | (A) | i. | | මුදුන්මුල පද්ධතිය | (ල. 01) |
| | | ii. | | කඳ අතු බෙදී තිබීම / පත්‍ර වල ජාලාභ නාරටි වින්‍යාසය | (ල. 01) |
| | | iii. | | අතු වලට ආධාරකයක් ලෙස ක්‍රියා කිරීම | (ල. 01) |
| | | iv. | | සුදුසු පිළිතුරකට | (ල. 02) |
| | | v. | (a) | උත්ස්වේදනය | (ල. 01) |
| | | | (b) | සුදුසු පිළිතුරකට | (ල. 01) |
| | (B) | i. | | කැරට් | (ල. 01) |
| | | ii. | | ඉඟුරු | (ල. 01) |
| | | iii. | | ඉඟුරු | (ල. 01) |
| | | iv. | | පතොක් | (ල. 01) |
| | | v. | | කරපිංචා | (ල. 01) |
| | | | | | මු.ල.12 |



LIVEWORKSHEETS